ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - IV වන මට්ටම

දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2023/2024

ගිවිසුම් නීතිය - LLU4805

කාලය : පැය එකයි (01) යි

---

දිනය: **2025.01.08** වේලාව : පෙ.ව.09.30 - පෙ.ව.10.30

---

මුළු ප්‍රශ්න ගණන - දෙකයි 02

ප්‍රශ්න එකකට (01) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. (i). ගිවිසුම් නීතිය තුල ඒකපාර්ශ්වික වැරදීම සහ අන්‍යෝන්‍ය වැරදීම යන සංකල්පයන් අතර වෙනස ඉස්මතු කරමින් නිර්වචනය කරන්න.

(ලකුණු 08)

(ii). දේපළ ආයෝජකයෙකු වන ලිලානි කොළඹ ප්‍රදේශයෙන් නිවසක් මිලදී ගැනීමට කැමැත්තක් දක්වයි. ඇය නිවසේ විකුණුම් කරු වන රංජිත්ව හමු වූ අතර ඔහු විසින් ඇයට පවසන්නේ එම දේපළ මෑතක දී ප්‍රතිසංස්කරණය කර ඇති බවත් එය විශිෂ්ට තත්ත්වයේ පවතින බවත් ය. මෙම ප්‍රකාශය මත පදනම්ව, මුලින් තමා අදහස් කළ මුදලට වඩා වැඩි මුදලකට නිවස මිලදී ගැනීමට ලිලානි එකඟ වූවාය. නිවසට ගිය පසු, නිවස අබලන් තත්වයේ පවතින බවත් කිසිදු අලුත්වැඩියාවක් සිදු කර නොමැති බවත් ලිලානි අනාවරණය කරගත්තාය. ඇය හඳුනාගත්තේ රංජිත් නිවස අබලන් තත්ත්වයේ පවතින බව දනිමින්ම විකුණුම් මිල වැඩි කිරීම සඳහා එවන් ප්‍රකාශයක් කර ඇති බවයි.

අදාළ නඩු නීතිය ඇසුරෙන් ලිලානිට ලබා ගත හැකි නීතිමය පිළියම් පිළිබඳ ව උපදෙස් දෙන්න.

(ලකුණු 12)

2. (i). ගිවිසුම් නීතිය තුල උත්තර්ජනය සහ අයුතු බලපෑම් යන සංකල්පයන්හි වෙනස ඉස්මතු කරමින් නිර්වචනය කරන්න.

(ලකුණු 08)

(ii) ප්‍රියා සමන්තාට අයත් කොළඹ පිහිටි රූපලාවණ්‍යාගාරයක සේවිකාවකි. ප්‍රියාගේ සේවා ගිවිසුමේ වගන්තියක සඳහන් වූයේ "ඔබ අදාළ ව්‍යාපාරයෙන් ඉවත් වී වසර 12ක් ගතවන තෙක් ඒ හා සමාන ව්‍යාපාරයක් ලංකාවේ කිසිදු ස්ථානයක නොඇරඹිය යුතු අතර එවන් තරගකාරී ව්‍යාපාරයකට සම්බන්ද නොවිය යුතුයි." යන්නයි. සමන්තාගේ රූපලාවණ්‍යාගාරයේ වසර දෙකක් සේවය කිරීමෙන් අනතුරුව ඉන් ඉවත් වූ ප්‍රියා නුවර ප්‍රදේශයේ ඇයගේ ම රූපලාවණ්‍යාගාරයක් විවෘත කළාය.

ගිවිසුමේ සඳහන් ඉහත වගන්තිය නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි ද යන්න පිළිබඳ ව සමන්තා ඔබේ උපදෙස් පතයි. ඔබේ පිළිතුර සනාථ කිරීමට අදාළ නඩු තීන්දු උපුටා දක්වමින් සමන්තාට උපදෙස් දෙන්න.

(ලකුණු 12)

****සියළුම හිමිකම් ඇවිරිණි****